# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය

IHRA
UNIVERSITY OF COLOMBO

කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන සුදුසු අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් සහ අනෙකුත් විස්තර මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වෙබ් අඩවියෙන් බාගත හැකිය. (https://www.ihra.cmb.ac.lk/vacancies/) නියමිත ආකෘති පත්‍රවල ඉදිරිපත් කරන ලද අයදුම්පත් පමණක් සලකා බලනු ලැබේ.

මෙම තනතුරු සඳහා අයදුම්පත් 2025.10.18 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි vacancies@ihra.cmb.ac.lk විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. කරුණාකර අයදුම් කරන තනතුර තැපෑලෙහි විෂයෙහි පැහැදිලිව දක්වා ඇති බවට වග බලා ගන්න.

**A. කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ තනතුරු:**

**සුදුසුකම්:**

1. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් එකවර විෂයන් හයකින් (06) සමත් වී තිබිය යුතු අතර, පහත දක්වා ඇති විෂයන් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතුය.
   - i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   - ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   - iii. ගණිතය
2. අ.පො.ස (උසස් පෙළ) විභාගය එකවර විෂයන් තුනකින් (පොදු සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබිය යුතුය. (පැරණි විෂය නිර්දේශය යටතේ එකවර විෂයන් තුනකින් සමත් වීම මේ සඳහා සලකා බලනු ලැබේ.)
3. පහත සඳහන් අමතර සුදුසුකම් ඇති අයට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ;
   - a. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු කාලයක පරිගණක යෙදුම් පිළිබඳ දැනුම පිළිගත හැකි සහතිකයක්
   - b. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**සටහන:**

**සුදුසුකම්:** a. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
b. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**තෝරා ගැනීම:** ලිඛිත විභාගය, ප්‍රායෝගික පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය මගින්
**වැටුප් ප්‍රමාණය:** රු. 49,475-17x540-58,655 (මාසිකව)

**B. වැඩ සහායක තනතුර III ශ්‍රේණිය:**

**සුදුසුකම්:** අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබිය යුතුය. අවම වශයෙන් සම්මාන දෙකක් හෝ වාර දෙකකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබිය යුතුය.

**වයස:** අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
**තෝරා ගැනීම:** ලිඛිත තරඟකාරී විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්
**වැටුප් ප්‍රමාණය:** රු. 42,775-16x450-49,975 (මාසිකව)

**සටහන:**

**සුදුසුකම්:** a. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
b. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය
c. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

අසම්පූර්ණ අයදුම්පත් හෝ සුදුසුකම් සහ පළපුරුද්ද සත්‍යාපනය කරන සහතිකවල සහතික කළ ඡායා පිටපත් ඇතුළුව අවශ්‍ය විස්තර නොමැති අයදුම්පත් හෝ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**වැඩබලන අධ්‍යක්ෂක**
මානව සම්පත් අභිවර්ධන ආයතනය
275, බෞද්ධාලෝක මාවත, කොළඹ 7